**ඔපෙක් අරමුදලින් මාර්ග ජාල සංවර්ධන ව්‍යාපෘතිය - 2024**

----------------------------------------------------------------

ඔපෙක් අරමුදලින් මාර්ග ජාල සංවර්ධන ව්‍යාපෘතියේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය**

ණය ගිවිසුම අනුව, එවකට වරාය, නාවික හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ.

බස්නාහිර, වයඹ, මධ්‍යම, දකුණ සහ සබරගමුව පළාත්වල ජාතික මාර්ග කි.මී. 202 ක් වැඩිදියුණු කිරීමත්, පාලම් ප්‍රතිසංස්කරණය කිරීම සහ පුළුල් කිරීම මඟින් මාර්ග ජාල සම්බන්ධතා වැඩිදියුණු කර ප්‍රවාහන ක්ෂේත්‍රය සඳහා පවතින ඉල්ලුම සම්පූර්ණ කිරීම සහ ශ්‍රී ලංකාවේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුවේ ප්‍රමුඛ ස්ථානයක් ස්ථාපිත කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ.
ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 7,121.32 කට සමාන වූ එ.ජ.ඩො. මිලියන 62.46 ක් වන අතර ඉන් රු.මිලියන 4,560 කට සමාන වූ එ.ජ.ඩො. මිලියන 40 ක් සැපයීම සඳහා අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල සමඟ එකඟ වී තිබුණි. ඉතිරි මුදල වූ රු.මිලියන 2,561.32 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට බලාපොරොත්තු වේ.

ව්‍යාපෘතියේ කටයුතු 2013 ජනවාරි 16 දින ආරම්භ කරන ලද අතර, 2016 දෙසැම්බර් 31 දින වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපාතිය අවසන් කරන දිනය 2025 පෙබරවාරි 28 දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 තත්ත්වාගණනය කළ මතය**

මාගේ වාර්තාවේ 2.1 වගන්තියේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගනණ ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩුව/විගණන නිරීක්ෂණය | මුදල රු.මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ඉතිරි පෞද්ගලික ඉඩම් කැබලි 1064 සඳහා රු. මිලියන 457.74 ක වන්දි ගෙවීමට සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, | 457.74 | ඉතිරි ඉඩම්, ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ විවිධ අදියරවල පවතී. මෙම ඉඩම්වල අයිතිය පවරා ගැනීම් අවසන් කර නොමැති අතර | මූල්‍ය ප්‍රකාශන අත්සන් කිරීමට පෙර ගණකාධිකාරීවරයා අදාළ රා.අ.ගි.ප්‍ර. සමඟ අනුකූල වීම සහතික |

| | | | | |
|---|---|---|---|---|
| | කෙරීගෙන යන වැඩ එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | | තක්සේරු කිරීම් සිදු කර නොමැත. | කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ යටතේ දක්වා ඇති ඉඩම් වන්දි සඳහා ගෙවියයුතු පොලී සහ අතුරු ගෙවීම් සහතික සඳහා වූ රු. මිලියන 100 ක ප්‍රතිපාදන සම්බන්ධයෙන් අදාළ හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි. | 100.00 | එකඟ වේ. 2025 මූල්‍ය ප්‍රකාශනවල අදාළ තොරතුරු හෙළිදරව් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත. | මූල්‍ය ප්‍රකාශන අත්සන් කිරීමට පෙර ගණකාධිකාරීවරයා අදාළ රා.අ.ගි.ප්‍ර. සමඟ අනුකූල වීම සහතික කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 05 හි 43(අ) ඡේදයට අනුව, එක් එක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සඳහන් වත්කම් සහ වගකීම්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනයේ අවසාන විදේශ විනිමය අනුපාතයට පරිවර්තනය කළ යුතුය. කෙසේ වෙතත්, ඉහත අවශ්‍යතාවයට අනුව ව්‍යාපෘතියේ විදේශ ණයට අදාළ විනිමය අනුපාත ගැලපීම ව්‍යාපෘතිය විසින් සිදුකර නොතිබුණි. | - | 2024.02.22 දිනැති රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 3/2024 හි දක්වා ඇති උපදෙස් වලට අනුකූලව 2024 වර්ෂය සඳහා විදේශ ණය සඳහා විනිමය අනුපාත ගැලපීම සිදු කර නොමැත. | මූල්‍ය ප්‍රකාශන අත්සන් කිරීමට පෙර ගණකාධිකාරීවරයා අදාළ රා.අ.ගි.ප්‍ර. සමඟ අනුකූල වීම සහතික කළ යුතුය. |

## 2.2 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම / විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| කොන්ත්‍රාත් කොන්දේසි 128 උප වගන්ති | භාරගැනීමේ සහතිකය (Taking Over Certificate) නිකුත් කරන දිනයේදී රසායනාගාර උපකරණ සහ ගෘහ භාණ්ඩ කොන්ත්‍රාත්කරු වෙත ආපසු ලබා දිය යුතුය. කෙසේ වෙතත්, ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ අංක 4/2 පාලම ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධයෙන් ක්ෂේත්‍ර රසායනාගාර උපකරණ සඳහා එකවර ගෙවීමක් ලෙස රු. මිලියන 6 ක මුදලක් 2024 දෙසැම්බර් 31 වන විට ව්‍යාපෘතිය විසින් ගෙවා තිබුණි. ප්‍රමාණ පත්‍ර (BOQ) | මාර්ග සංවර්ධන අධිකාරියේ (RDA) ඇති රසායනාගාර උපකරණ අවශ්‍ය ප්‍රමාණය ඉක්මවා යයි.<br>ඒ අනුව, ව්‍යාපෘතිය අවසන් වූ පසු එම අයිතම නැවත කොන්ත්‍රාත්කරු වෙත පවරාදෙනු ඇත.<br>කෙසේ වෙතත්, අනාගත ප්‍රසම්පාදන වලදී අහිතකර කොන්ත්‍රාත් කොන්දේසි වෙනස් කිරීමට පියවර ගනු ලැබේ. | කොන්ත්‍රාත්තුවේ විශේෂ කොන්දේසි බලාත්මක කිරීමට පෙර ගැඹුරින් සමාලෝචනය කළ යුතුය. |

පිළිලෙ කිරීම අවසන් කිරීමට පෙර ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණික ඇගයීම් කමිටුව එම විශේෂ කොන්ත්‍රාත් කොන්දේසිය සමාලෝචනය කර නොමැති බව නිරීක්ෂණය විය. එබැවින් එම අහිතකර කොන්ත්‍රාත් කොන්දේසි කොන්ත්‍රාත්කරුවන්ට අනවශ්‍ය ප්‍රතිලාභ ලබා දීමට සහ ව්‍යාපෘති පිරිවැය ඉක්මවා යාමට හේතු විය හැක.

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘති කටයුතුවල භෞතික ප්‍රගතිය**

(අ) (i) **ඉඩම් අත්පත් කර ගැනීම**

| සංරචකය | ක්‍රියාකාරකම | 2024 දෙසැම්බර් 31 දිනට | | ප්‍රමාදය / විගණන නිරීක්ෂණය | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත භෞතික කාර්යසාධනය | ළඟා කරගෙන ඇති කාර්යසාධනය | | |
| | | කැබලි | කැබලි | | |
| ඉඩම් අත්පත් කර ගැනීම | මාර්ග සංවර්ධන අධිකාරියට හිමිකම් පැවරීම | 2,772 | 191 | විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, ඉඩම් අත්පත් කරගැනීමේ පනතේ 38(අ) වගන්තිය ප්‍රකාරව ව්‍යාපෘතිය විසින් ඉඩම් කැබලි 2,772 ක් අත්පත් කර ගැනීමට කටයුතු කර තිබුණි. ඉඩම් කැබලි 820 ක් සඳහා රු.මිලියන 290.26 ක වන්දි සහ ඉඩම් කැබලි 266 ක් සඳහා රු.මිලියන 53.26 ක ප්‍රමාද පොලී 2024 දෙසැම්බැර් 31 දිනට ගෙවා තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය අවසන් වන තෙක් පනතේ 17 වගන්තිය යටතේ ඉතිරි ඉඩම් කැබලි සඳහා තක්සේරු කිරීමේ ක්‍රියාවලිය අවසන් කිරීමට නොහැකි වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වගන්තියට අනුව ව්‍යාපෘති | දුර්වල අධීක්ෂණය හේතුවෙන් ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු ප්‍රමාද වීම. |

අධීක්ෂණ ඒකකයට ඉඩම් කැබලි 191 ක් පමණක් අත්කර ගැනීමට හැකි වී තිබුණි.

**කළමනාකරණයේ ප්‍රතිචාරය** එකඟ විය.
වත්මන් තත්ත්වය විගණනයට ඉදිරිපත් කර ඇත.
.

**විගණකගේ නිර්දේශය** ව්‍යාපෘතිය මගින් ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලීන් ඉඩම් අත්පත් කර ගැනීමේ සැලැස්මට අනුකූලව ක්‍රියාත්මක වන බවට සහතික විය යුතු අතර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1)(ඇ) වගන්තියේ විධිවිධානවලට අනුකූලව සිදු කරන ලද සමාලෝචනයේදී ලිඛිත උපදෙස් නිකුත් කළ යුතුය.

(ii)

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘතියේ දත්ත සමුදායෙන් ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාවල අදාළ තොරතුරු නොතිබූ බැවින්, ඉඩම් අත්පත් කර ගැනීමට අදාළ ඉඩම් ප්‍රමාණය විගණනයේදී සමාලෝචනය කළ නොහැකි විය. | අත්පත් කරගත් ඉඩම ප්‍රමාණය 10(1) තීරණයට අදාළ ලේඛනයෙන් උපුටා ගැනීමට නියමිත අතර එය දත්ත සමුදායට ඇතුළත් කිරීමට පියවර ගනු ලැබේ. | ඉඩම් අත්පත් කර ගැනීම් පිළිබඳ සියලු විස්තර ඇතුළත් කරමින් නිසි දත්ත සමුදායක් පවත්වා ගත යුතුය. |

**(ආ) පොලී ගෙවීම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| 2024 දෙසැම්බර් 31 දිනට වන්දි ගෙවීම් ප්‍රමාදය වෙනුවෙන් හඳුනාගත් මුළු පොලී මුදල 2024 දෙසැම්බර් 31 දින දක්වා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අදාළ ඉඩම් අත්පත් කර ගැනීමේ පිරිවැයෙන් සියයට 12 සිට 39 දක්වා වූ බව නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂය අවසානයට වන්දි ගෙවීමට තවදුරටත් ඉඩම් කැබලි 1952 ක් ඉතිරිව තිබුණු අතර එම නිසා අනාගතයේදී පොලී පිරිවැය වැඩි විය හැකිය. | මුළු ඉඩම් කැබලි 2,772 න් ඉඩම් කැබලි 820 ක් සඳහා වන්දි ගෙවා තිබුණි. කෙසේ වෙතත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති වීම සහ සමහර ඉඩම් හිමියන් ගෙවීම සඳහා අවශ්‍ය ලියකියවිලි ලබා දීමට අපොහොසත් වීම හේතුවෙන් වන්දි ක්‍රියාවලියේ ප්‍රමාදයක් පවතිනු ඇත. | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය නිසි ක්‍රියාකාරී සැලැස්මක් සහිතව ක්‍රියාත්මක කළ යුතු අතර ඒ අනුව අයවැය ප්‍රතිපාදන ලබා ගත යුතුය. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රමාණ පත්‍ර (BOQ) අගය ඉක්මවන කොන්ත්‍රාත්තුවේ මිල අවිනිශ්චිතතා (Price Contingencies) ගෙවීම සඳහා නිසි අනුමැතිය ලබා ගත යුතු වුවද, ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ පාලම් අංක. 4/2 සහ 3/1 ඉදිකිරීමේ කොන්ත්‍රාත්තු දෙක සඳහා පූර්ව අනුමැතියකින් තොරව පිළිවෙලින් රු. මිලියන 70.12 ක් සහ රු. මිලියන 101.81 ක් | මිල ඉහළ යාම හේතුවෙන් මිල අවිනිශ්චිතතා ඉක්මවා ගොස් ඇති අතර ඒ අනුව ප්‍රමාණ පත්‍ර අගය සංශෝධනය කිරීමට පියවර ගනු ලැබේ. | අනුමැතිය ලබා ගැනීම සඳහා විශේෂ අවධානයක් යොමු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මිල අවිනිශ්චිතතා සඳහා ප්‍රමාණ පත්‍ර අගය ඉක්මවා ගෙවීම් කර ඇති බව නිරීක්ෂණය විය. | | |
| (ආ) | 2024 වර්ෂයේ ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ අංක. 4/2 සහ 3/1 පාලම් ප්‍රතිසංස්කරණය කිරීමට අදාල අතුරු ගෙවීම් සහතික (IPC) 22 කට අනුව, පූර්ව අනුමැතියක් ලබා ගැනීමෙන් තොරව ප්‍රමාණ පත්‍රවල සඳහන් ප්‍රමාණයන් ඉක්මවීම් සඳහා රු. මිලියන 12.45 ක ගෙවීම් සිදු කර ඇති බව හඳුනා ගෙන තිබුණි. | සිදු කරන ලද තත්‍ය කාර්යයන්ට සරිලන පරිදි ප්‍රමාණ පත්‍ර සංශෝධනය කිරීමට පියවර ගෙන ඇත. කාල දීර්ඝ කිරීම් හේතුවෙන් ප්‍රමාණ පත්‍රවල බිල් අංක. 1 හි අදාල ප්‍රමාණයන් ඉක්මවා ගොස් තිබුණි. | අනුමැතිය ලබා ගැනීම සඳහා විශේෂ අවධානයක් යොමු කළ යුතුය. |
| (ඇ) | පිළිගත හැකි හේතූන් මත වැඩ නිම කිරීම සඳහා කොන්ත්‍රාත්කරුට කාලය දීර්ඝ කිරීම් (EOT) ලබාගැනීමට හිමිකම් ඇතත්, කාර්යාල නඩත්තුව, නිවාස නඩත්තුව, ඉංජිනේරුවරුන්ගේ වාහන සහ අනෙකුත් මෙහෙයුම් කාර්ය මණ්ඩලය සහ රසායනාගාර උපකරණ නඩත්තු කිරීම ආදිය සඳහා අතිරේකව රු. මිලියන 6.96 ක මුදලක් වැය කර තිබුණි. | ව්‍යාපෘති කාල සීමාව දීර්ඝ කිරීම හේතුවෙන් විගණන වාර්තාවේ සඳහන් අයිතමය වැඩි වී ඇති අතර, ප්‍රමාණ පත්‍ර සංශෝධනය කිරීමට පියවර ගෙන ඇත. | කාලය දීර්ඝ කිරීම් නිසා ඇතිවන අමතර වියදම් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය. |
| (ඈ) | මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රතිසංස්කරණය කරන ලද මාර්ග හතරක් කොන්ත්‍රාත්තුවේ පොදු කොන්දේසි 10.1 වගන්තියට අනුව මාර්ග සංවර්ධන අධිකාරියට (RDA) භාර දී ඇතත්, පොල්ගහවෙල - කෑගල්ල මාර්ගයේ අංක 3/2 පාලම ප්‍රතිසංස්කරණය කිරීම මාර්ග සංවර්ධන අධිකාරියට භාර දීමට ව්‍යාපෘතිය විසින් 2024 දෙසැම්බර් 31 දින දක්වා පියවර ගෙන නොතිබුණි. | පොල්ගහවෙල - කෑගල්ල මාර්ගයේ අංක 3/2 පාලම භාරදීමට අදාළ ලේඛන කාර්යාල ගබඩාවල සොයා ගැනීමට අපහසු වන අතර විධායක ඉංජිනේරුවරයාගෙන් පිටපතක් ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | ලේඛන භාර දීම කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය. |
| (ඉ) | පේරාදෙණිය - බදුල්ල - චෙන්කලඩි මාර්ග කොටස (A005) පුනරුත්ථාපනය කිරීමේ සහ වැඩිදියුණු කිරීමේ කටයුතු අතරතුර නඩත්තු කටයුතු කොන්ත්‍රාත්කරු විසින් සිදු කර නොතිබුණි. එබැවින් 2019 කාලය තුළ ඉහත මාර්ග කටයුතු සහ නඩත්තු කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියට රු. මිලියන 7.71 ක මුදලක් දැරීමට සිදු විය. අතුරු ගෙවීම් සහතිකවලින් කොන්ත්‍රාත්කරුගෙන් මුළු මුදලම එකවර අයකර ගැනීමට ව්‍යාපෘතිය කටයුතු කර නොතිබුණි. කොන්ත්‍රාත්කරු එම මුදල පසුව වාරික 10 කින් පියවීමට එකඟ වුවද, 2024 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්කරු විසින් වාරික 05 ක් පමණක් පියවා තිබූ බවත් ඉතිරි රු. මිලියන 4.21 ක් | 2019.03.01 සිට 2019.06.30 දක්වා කාලය තුළ කොන්ත්‍රාත්කරු මාර්ගය නඩත්තු කර නොතිබුණි. එමනිසා, සියලුම වළවල් පිළිසකර කිරීමට, පැති කාණු පිරිසිදු කිරීමට සහ මාර්ග දෙපස ඇති කැලෑ එළි කිරීමට විධායක ඉංජිනේරු (කඩුගන්නාව) වෙත උපදෙස් දෙන ලදී. | කොන්ත්‍රාත්කරුගේ වගකීම් කොන්ත්‍රාත් කොන්දේසි අනුව ප්‍රවේශමෙන් සමාලෝචනය කළ යුතු අතර, එම හිඟ ශේෂයන් කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමට කඩිනමින් පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තවමත් හිඟ බවත් නිරීක්ෂණය විය. ඉහත විෂමාචාර සඳහා වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | | |
| (ඊ) | නිසි අනුමැතියකින් තොරව කොන්ත්‍රාත් මිල ඉක්මවා යා නොහැකි වුවද, ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ අංක 4/2 සහ 3/1 පාලම් ඉදිකිරීමේ කටයුතු 2024 දෙසැම්බර් 31 දින වන විට කොන්ත්‍රාත් මිල රු. මිලියන 34.79 කින් ඉක්මවා ඇති බව නිරීක්ෂණය විය. | මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති වටිනාකම් වල එක් එක් කොන්ත්‍රාත්තුව සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ඇතුළත් වේ. කෙසේ වෙතත්, ගෙවන ලද ප්‍රමාණයන් කොන්ත්‍රාත් වටිනාකම ඉක්මවා නොයන අතර පැහැදිලිවම අනුමත කොන්ත්‍රාත් මිල තුල ඇතුළත්ව ඇත. | අනුමැතිය ලබා ගැනීමට පියවර ගත යුතුය. |

## 3.3 ඌන උපයෝජිත සම්පත්

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2013 ජුනි මස සිට ආරම්භ වන වසර දහයකට වැඩි ව්‍යාපෘති කාලය තුළ එ.ජ.ඩො. ඩොලර් මිලියන 62.21 ට සමාන රු. මිලියන 7,092.77 න් 2024 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතිය භාවිතා කර තිබුණේ ණය මුදලින් රු. මිලියන 5,552.75 ට සමාන එ.ජ.ඩො. ඩොලර් මිලියන 37.25 ක් සහ දේශීය අරමුදලින් රු. මිලියන 591.29 ක් පමණි. ව්‍යාපෘතියේ මූලික අවසන් දිනය 2016 දෙසැම්බර් 31 දිනය වුවද, 2024 දෙසැම්බර් 31 වන විටත් එ.ජ.ඩො. ඩොලර් මිලියන 2.75 ක් භාවිතයට ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | ඉතිරි ණය මුදල ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ අංක 4/2 පාලම ප්‍රතිසංස්කරණය කිරීම සහ අංක 3/1 පාලම පුළුල් කිරීම සඳහා යොදා ගන්නා ලදී. ඉතිරි මුදල මහරගම - පිළියන්දල (බී) කොටස (කි.මී. 2+000 - කි.මී. 3+700) සඳහා යොදා ගනු ලබන අතර, මේ වන විට ප්‍රසම්පාදනය සඳහා ණය නියෝජිතායතනයේ එකඟතාවය අපේක්ෂා කෙරේ. | ව්‍යාපෘතිය විසින් නිසි ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු අතර අයවැය සහ වගකීම් ඒ අනුව නියම කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා අයවැයෙන් වෙන් කරන ලද ප්‍රතිපාදනය රු. මිලියන 461.48 ක් වූ අතර එයින්, සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතිය භාවිතා කර තිබුණේ රු. මිලියන 344.14 ක් පමණි. එබැවින්, 2024 දෙසැම්බර් 31 වන විට රු. මිලියන 117.34 ක් හෙවත් සියයට 25.43 ක ඉතිරියක් විය. එබැවින් ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය විසින් අයවැයගත ප්‍රතිපාදන ඵලදායී ලෙස භාවිතා කර නොමැති බව නිරීක්ෂණය විය. | පාලම් අංක 3/1 සහ 4/2 නිම නොකිරීම නිසා ඉතිරියක් විය. 3/1 පාලමේ ජලනල මාරු කිරීමේ ප්‍රමාදය හේතුවෙන් වැඩ නියමිත වේලාවට නිම කිරීමට නොහැකි විය. | ණය අරමුදල ඵලදායී ලෙස භාවිතා කළ යුතුය. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- |
| කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2024 මාර්තු 16 දිනැති අංක. DMS/7777/MFAP ලිපියට අනුව, 2024 දෙසැම්බර් 31 දින දක්වා විවිධ විදේශ ආධාර ව්‍යාපෘතිය සඳහා අනුමත කාර්ය මණ්ඩලය තනතුරු 26 ක් විය. කෙසේ වෙතත්, අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා ජ්‍යෙෂ්ඨ ඉංජිනේරුවරයෙකු බඳවාගෙන තිබුණු බව නිරීක්ෂණය විය. තවද, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව පරිපාලන නිලධාරියෙකු, ලඝුලේඛකයින්/යතුරු ලියනය කරන්නන් දෙදෙනෙකු, කාර්යාල සහායකයෙකු සහ කාර්යාල කම්කරුවෙකු බඳවාගෙන තිබුණි. | විගණන වාර්තාවේ සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2025.03.06 දිනැති අංක DMS/7777/MFAP දරන ලිපිය මගින් අතිරේක තනතුරු 06 ක් අනුමත කරන ලදී. | සියලුම කාර්ය මණ්ඩල පත්වීම් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියට අනුකූල වන බවට ප්‍රධාන ගනන්දීමේ නිලධාරී සහතික විය යුතුය. |

### 3.5 පද්ධතිය සහ පාලන

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2019 මාර්තු 05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 හි 9.3 වගන්තියට අනුව, ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව අවම වශයෙන් මාස දෙකකට වරක්වත් රැස්විය යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ පවත්වා තිබුණේ රැස්වීම් දෙකක් පමණි. | විවිධ හේතූන් මත රැස්වීම් පවත්වා නොමැත. කෙසේ වෙතත්, ව්‍යාපෘතිවලට අදාළ කරුණු සහ ගැටළු වෙනත් රැස්වීම් වලදී සුදුසු පරිදි සාකච්ඡා කරන ලදී. | චක්‍රලේඛ උපදෙස් වලට අනුකූල විය යුතුය. |
| (ආ) | 2019 ජනවාරි 12 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/01/2019 අනුව, ව්‍යාපෘති අභ්‍යන්තර විගණන සමාලෝචන කමිටුවක් ස්ථාපිත කළ යුතු අතර අවම වශයෙන් වාර්ෂිකව රැස්වීම් 04 ක් පැවැත්විය යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂයේ කිසිදු රැස්වීමක් පවත්වා නොතිබුණි. | අභ්‍යන්තර විගණකවරයෙකු නොමැති වීම හේතුවෙන් අභ්‍යන්තර විගණන සමාලෝචන කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් වලට අනුකූල විය යුතුය. |